**සීමාසහිත ඉන්ෆො මීඩියා (පුද්ගලික) සමාගම - 2015**

---

සීමාසහිත ඉන්ෆො මීඩියා (පුද්ගලික) සමාගමේ ("සමාගම") 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය ප්‍රමාණයේ අස්ථිත්වයන් සඳහා (කුමපඅ සඳහා ශ්‍රීලංමුවාප්‍ර) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ("මණ්ඩලයේ") වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 අහිතකර මතය සඳහා පදනම

-------------------------------

(අ) අඛණ්ඩ ව්‍යාපාර අලාභය හා ඍණ ශුද්ධ වත්කම් තත්ත්වය හේතුවෙන් 2012 වර්ෂයේ සිට සමාගම අක්‍රියව පැවති 2015 දෙසැම්බර් 31 දිනට සමාගමේ ඍණ ශුද්ධ වත්කම් තත්ත්වය රු.4,496,257 ක් වූ අතර ඒ අනුව පිළිවෙලින් රු.185,511 ක මුළු ජංගම වත්කම් හා රු.4,681,768 ක මුළු ජංගම වගකීම් පොත්වලින් ඉවත් කිරීමට හා නැවත පොත්වලට ගැනීමට 2016 පෙබරවාරි 08 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කර තිබුණි. මෙම තත්ත්වයන් ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පෙන්නුම්කරන අතර එමගින්, අඛණ්ඩව පවත්වාගෙනයාම සම්බන්ධයෙන් සමාගම සතු හැකියාව පිළිබඳව ප්‍රබල සැකයක් මතුවිය හැකිය. කෙසේවෙතත්, මෙම කරුණු සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ආ) කුඩා හා මධ්‍යම පරිමාණයේ අස්ථිත්වයන් සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLFRS for SMES) හා අනුකූලවීම පිළිබඳව පැහැදිලි හා සම්පූර්ණ ප්‍රකාශයක් සමාගම විසින් මූල්‍ය ප්‍රකාශනවල සිදු කර නොතිබුණි.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1 අහිතකර මතය

----------------

මෙහි අහිතකර මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත්බව හේතුවෙන් 2015 දෙසැම්බර් 31 දිනට ඉන්ෆො මීඩියා (පුද්ගලික) සමාගමේ මූල්‍ය තත්ත්වය හා මුදල් ප්‍රවාහ කුඩා හා මධ්‍ය පරිමාණ අස්ථිත්වයන් සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (කුමපඅ සඳහා ශ්‍රීලංමුවාප්‍ර) අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

--------------------------------------

#### 2.2.1 කුමපඅ සඳහා ශ්‍රීලංමුවාප්‍ර හා අනුකූල වීම

------------------------------------------

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදා ගන්නා ලද ගිණුම්කරණ ප්‍රමිති අනාවරණය කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

--------------------

සමාලෝචිත වර්ෂය ආරම්භයේදී, 2014 දෙසැම්බර් 31 දිනට ප්‍රකාශයට පත් කරන ලද පහත දැක්වෙන ණයහිමි ගිණුම්වල අවසාන ශේෂයන් ආරම්භක ශේෂයන් ලෙස වැරදි සහගත ලෙස ඉදිරියට ගෙනවිත් තිබුණි. ඒ අනුව, මෙම ශේෂයන් දෙක අතර පහත දැක්වෙන වෙනස්කම් නිරීක්ෂණය විය.

| ගිණුම් විෂයයන් | 2014 දෙසැම්බර් 31 දිනට අවසාන ශේෂය | 2015 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| වෙනත් ණය හිමියන් | 259,500 | 860,000 | 600,500 |
| ඒඑන්සීඑල් ජංගම ගිණුම | 4,417,933 | 3,813,833 | 604,100 |

## 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, එම වසර සඳහා රු.2,500 ක විගණන ගාස්තු ගෙවීම හැර වෙනත් කිසිදු ක්‍රියාකාරකමක් සමාලෝචිත වර්ෂයේදී හා පෙර වර්ෂයේදී සිදුකර නොතිබුණි.

## 4. ගිණුම්කටයුතු භාවය හා යහ පාලනය

## 4.1 සංයුක්ත සැලැස්ම

සමාගම, එහි ආරම්භයේ සිටම සංයුක්ත සැලැස්මක් පිළියෙළ කර නොතිබුණි.